**මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 - 2016**

**-------------------------------------------------------------------------------**

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන සංවර්ධන සහයෝගීතා බැංකුව අතර 2011 මාර්තු 31 දින එළඹි අංක 4500062212011110472 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

**-------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුමට අනුව, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රමුඛතා මාර්ග කිලෝමීටර් 619.72 ක් වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො.මිලියන 556 කට සමාන රු.මිලියන 61,438 ක් වූ අතර එයින් එ.ජ.ඩො. මිලියන 500 කට සමාන රු.මිලියන 55,250 ක් චීන සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූනි 28 දින ආරම්භ කළ අතර 2014 ජූනි 28 අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවුවත්, ණය මුදලෙහි වලංගු කාල සීමාව ණය මුදලින් මුදල් ඉවත් කරගැනීම අවසන් වන තුරු දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ ආපසු ගැනීම්, ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(ඌ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

**(එ)** ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

**(අ)** 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

**(ඇ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

**(ඈ)** ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දේශීය බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙතින් ලබාගත් ණය මුදලින් රු.මිලියන 1,250 ක් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා වෙන් කර තිබුණි. කෙසේවුවත්, 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 1,100 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණ දායකත්වයක් ලෙස දක්වා තිබුණි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, අදාල වටිනාකම ව්‍යාපෘතිය මඟින් ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්වා තිබුණි.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය පහසුකම් ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය සඳහා | | 2016 දෙසැම්බර් 31 වන විට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| චීන සංවර්ධන සහයෝගීතා බැංකුව | 500 | 55,250 | 1,090 | 7.38 | 1,062.41 | 497.56 | 64,142 |
| ශ්‍රී ලංකා රජය | 56 | 6,188 | 100 | - | 41.00 | - | 7,043 |
| එකතුව | 556 | 61,438 | 1,190 | 7.38 | 1,103.41 | 497.56 | 71,185 |

ඉහත තොරතුරු වලට අනුව, 2016 දෙසැම්බර් 31 වන විටත් ණය පහසුකම යටතේ වෙන් කරන ලද ණය ප්‍රාග්ධනය මුළුමනින්ම පාහේ යොදාගෙන තිබුණි. කෙසේවුවත්, ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතින නිසා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් ලබා ගත් ණය මුදලෙන් වෙන් කර ගත් රු. මිලියන 1,250 ක මුදලින් සිදුකරමින් පවතී.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ලිපිගොනුවට අනුව, ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන යටතේ ප්‍රමුඛතා පදනම මත නුවරඑළිය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල කි.මී.504.8 ක ජාතික මාර්ග සහ කි.මී. 85.01 ක ප්‍රාදේශීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, ගුවන් පාලම් දෙකක් ඉදිකිරීම සහ පාලම් 46 ක් පුළුල් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට කි.මී. 532.41 ක ජාතික මාර්ග හා කි.මී. 97.30 ක ප්‍රාදේශීය මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ, ගුවන් පාලම් දෙකක ඉදිකිරීම් වැඩ සහ පාලම් 71 ක ප්‍රතිසංස්කරණ වැඩ අවසන් කර තිබුණු බව නිරීක්ෂණය විය.

**3.3** මතභේදාත්මක ස්වභාවයේ කරුණු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, මාර්ග පුනරුත්ථාපන කටයුතු හේතුවෙන් නිවාස හිමියන් 64 දෙනෙකුට දේපල හානි වීම් සිදුවී තිබුණු අතර තිහගොඩ - කඹුරුපිටිය, මාවරල - කොටපොල මාර්ගවල නිවාස හිමියන් තිදෙනෙකුගේ ඇස්තමේන්තුගත වන්දි ප්‍රමාණවත් නොවන නිසා ව්‍යාපෘතියට එරෙහිව නීතිමය පියවර ගෙන තිබුණි.

(ආ) බදුල්ල - කරමැටිය - ආඳාඋල්පත මාර්ගය හා තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ පුනරුත්ථාපනය කරන ලද මාර්ග කොටස් පිළිවෙලින් 2014 සැප්තැම්බර් 15 හා 2015 ජූනි 22 යන දිනවල මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබූ අතර ඒවාට 2014 දෙසැම්බර් ඇතිවූ ගංවතුර නිසා හානි සිදුවී තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 131.91 ක් වූ නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කර ඇති බව සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 19.48 ක් ණය වලින් ලැබුණු මුදල් වලින් නිදහස් කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේවුවත්, රක්ෂණ ආවරණ වලින් සිදුවූ හානියේ පිරිවැය ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳව ව්‍යාපෘතිය සලකා බලා නොතිබුණි. තවදුරටත්. මෙම අතිරේක වැඩ කටයුතු ව්‍යාපෘතියේ විෂය සීමාව ඉක්මවා යාමක් ලෙස සැලකිය හැකි අතර පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීමෙන් පසු ජාතික මාර්ග නඩත්තු කිරීමේ වගකීම මාර්ග සංවර්ධන අධිකාරියට රැඳී පැවතුණි.